සංශෝධන අංක 05

R 8088


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


12 NOV 2021

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01/36/01/2015

ඔබේ අංකය / உமது இல. / Your No.: MF/AD/2/7-1/ධී.ප./පොදු11

දිනය / திகதி / Date: 2021 නොවැම්බර් 08 දින

ලේකම්,

ධීවර අමාත්‍යාංශය.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය (ධීවර නිලධාරී තනතුර) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ සමාංක හා 2021.08.09 දිනැති ලිපිය හා බැඳේ.

02. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය (ධීවර නිලධාරී තනතුර) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි අංක 7.1 සහ 7.2.4 දරන ඡේද මේ සමග අමුණා ඇති සංශෝධන ලැයිස්තුව පරිදි සංශෝධනය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.11.03 දින අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

කළේ./ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

ඇමුණුම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණය (ධීවර නිලධාරි තනතුර) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

හතරවන සංශෝධනය - සංශෝධිත ලැයිස්තුව

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th></tr>
<tr><td>1</td><td>7.1</td><td>බඳවා ගැනීමේ ප්‍රතිශතයන්:<br><table><tr><td>ධාරාව</td><td>ප්‍රතිශතය</td></tr><tr><td>විවෘත</td><td>50% (සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් 75%ක් පිරිමි නිලධාරීන් ද 25%ක් කාන්තා නිලධාරිනියන් ද බඳවා ගැනේ)</td></tr><tr><td>සීමිත</td><td>50%</td></tr><tr><td>කුසලතා</td><td>අදාළ නොවේ</td></tr></table></td></tr>
<tr><td>2</td><td>7.2.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය:<br>ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 25%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන කාන්තා අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන දෙකේම ඒකාබද්ධ ලකුණුවල කුසලතා අනුපිළිවෙළින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් හා 25%ක් කාන්තා අයදුම්කරුවන්ගෙන් ද පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.</td></tr>
</table>

08/11/2024